2019 අංක 02 දරන විස්තර සටහන

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

2019 අගෝස්තු 30

**සංචාරක කර්මාන්තය සඳහා සහන සලසාදීම දැක්වෙන**

**2019 අංක 01 දරන චක්‍රලේඛයේ අර්ථ දැක්වීම**

සංචාරක කර්මාන්තයට සහන සලසාදීම පිළිබඳ 2019 මැයි 21 දින නිකුත් කල 2019 අංක 01 දරන චක්‍රලේඛය සම්බන්ධ අර්ථ දැක්වීම් පහත පරිදි වේ.

1. **ලියාපදිංචිය සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා**

   සංචාරක කර්මාන්තය සඳහා ලබා දී ඇති සහන, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති සංගීත කණ්ඩායම් සඳහා ද ලබා දීමේ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එම සහන ලබා ගැනීමට බලාපොරොත්තු වන එවැනි පුද්ගලයන් හෝ ආයතන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වන බව බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත දැනුම් දෙනු ලැබේ.